**රත්තොට ප්‍රාදේශීය සභාව - 2023**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රත්තොට  ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ  තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රත්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය  තත්ත්වය  සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ ගබඩා ණයහිමි කරන ලද රු.431,999 ක් සමාලෝචිත වර්ෂයේ ගෙවීම් කිරීමේදී ගබඩා ණය හිමියන් හර නොකර විවිධ ණය හිමියන් හරකර තිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරිමට කටයතු කරන බව. | නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගන්නා ලද එකතුව රු. 1,483,136 ක ලිපි ද්‍රව්‍ය ගබඩා ණයහිමි ගිණුම බැර කර නොතිබුණි . | -එම- | -එම- |
| (ඇ) | ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් රු.135,500 ක ඉඩම් 5 ක් හා රු.84,350 ක ගොඩනැගිලි 02 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 07 කට අදාල ශේෂයන් හා ඒවාට අදාල උපලේඛණවල ශේෂයන් සමඟ සැසඳීමේදී රු. 27,644,913 ක වෙනසක් පැවතුණි. | තොරතුරු හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | ගිණුම් ශේෂ නිවැරදි කළයුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.792,800 ක වත්කම් විෂයයන් 09 ක් හා එකතුව රු.5,257,725 ක බැරකම් විෂයයන් 04 කට අදාල ලිපිගොනු, ලේඛන සහ යාවත්කාලීන කරන ලද ආදායම් ලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය | තොරතුරු හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | එක් එක් ශේෂයන් තහවුරු කිරීම සඳහා ලේඛන හා ලිපිගොනු පවත්වාගත යුතුය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට වසර 5 ඉක්ම වූ රු.405,686 ක වෙළඳ බලපත්‍ර හිඟ ශේෂයක් අයකර නොතිබුණි. | දීර්ඝ කාලීනව පැවත එන ශේෂයක් වන අතර,ලේඛණවලින් කපා හැරීම සඳහා කටයුතු කරමින් පවතින බව. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්**

නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) පාර්ලිමේන්තු පනත්** | | | |
| **(i) 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත** | | | |
| ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව | සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යන ත්‍රීරෝද නැවතුම්පලවල් විධිමත් කිරීමට, පාලනය කිරීමට හා ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි . | ත්‍රී වීල් රථ නැවතුම්පලවල් හදුනා ගෙන විධිමත් කර අදාළ ගාස්තු අයකිරීමට කටයුතු කරමින් පවතින බව. | පනතේ විධිවිධාන අනුගමනය කළයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| **(ii)** | **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| | 24 වගන්තිය | සභාව මගින් පවත්වාගෙන යනු ලබන පාරවල් සහ පටු මංමාවත්වල නාම ලේඛනයක් දක්වමින් සභාවට අයත් සියළුම මාර්ග ඇතුළත් කර ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන ගොස් නොතිබුණි. | වසම් මට්ටමින් මිනින්දෝරු මහතෙකු සමග GPS තාක්ෂණය මගින් ඉඩම් මැන පිඹුරුපත් සකස් කරමින් පවතින අතර,වසම් 2 ක ඉඩම් මැන අවසන් කර ඇති බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළයුතුය. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | මුදල් රෙගුලාසි 571(3) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කාලය ඉකුත් වූ රු.1,384,808 ක තැන්පතු 75 ක් නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | **චක්‍රලේඛ** | | | |
| (i) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 1(v) ඡේදය | ජනක බණ්ඩාර තෙන්නකෝන් මාවතේ කඩ කාමර 6 ක එක්වන් මුදල වාරික වශයෙන් අයකිරීමට ඉඩකඩ ලබාදී තිබුණද, මහ බැංකු පොලී අනුපාතය මත ගණන් බැලූ පොලියක් අය කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් එක්වන් මුදල හා ඒ සඳහා වන පොලී රු.3,141,246 ක් අයකර නොතිබුණි. | ලිපි ගොනු පරීක්ෂා කර අදාළ කඩ හිමියන් වෙත එක්වන් මුදල් ගෙවන ලෙස ලිඛිතව දන්වා , අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (අ) ඡේදය | පැය 8 සම්පූර්ණ නොකළ නිවාඩු දින 21 ක් සඳහා නිලධාරීන් 7 දෙනෙකුට රු. 34,920 ක නිවාඩු දින වැටුප් ගෙවීම් කර තිබුණි . | ඉදිරියේදි පැය 8 ක කාලයක් රාජකාරි ඉටු කර ඇතිදැයි පරීක්ෂා කිරීමෙන් අනතුරුව ගෙවීම් සිදු කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු සිදුකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,323,490 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,916,268 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,315,000 | 1,415,285 | 1,292,969 | 3,001,907 | 1,315,000 | 1,365,601 | 1,327,818 | 2,879,591 |
| (ii) | කඩ කුලී | 4,639,050 | 5,126,953 | 4,677,613 | 3,970,528 | 4,519,050 | 5,121,628 | 5,556,153 | 3,521,187 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,150,000 | 1,313,800 | 1,313,800 | 406,386 | 970,000 | 1,018,450 | 1,017,750 | 406,385 |
| (iv) | වෙනත් ආදායම් ජල | 3,200,000 | 3,486,153 | 3,621,298 | 10,673,585 | 8,000,000 | 6,807,310 | 8,348,935 | 10,808,730 |
| | එකතුව | 10,304,050 | 11,342,191 | 10,905,680 | 18,052,406 | 14,804,050 | 14,312,989 | 16,250,656 | 17,615,893 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම් හා බදු** | | |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර එක් ඒකකයකින් රු.10,000 කට වඩා වැඩි හිඟ හිටි ශේෂ පවතින දේපල 34 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.594,838 ක හිඟ හිටි වරිපනම් ශේෂයක් අයකරගෙන නොතිබුණි. | හිඟ හිටි වරිපනම් ශේෂ අයකර ගැනිමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකළ යුතුය . |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 08 ක එකතුව රු.59,812,113 ක් පැවති අතර, ඉන් අය නොකර පවතින කාලය වසර 1 ට වැඩි හා වසර 5 ට අඩු ශේෂය රු.8,458,542 ක්ද වසර 5 ට වැඩි ශේෂය රු.10,397,409 ක් අයකර නොතිබුණි. | අයවියයුතු මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් අයකර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 04 ක එකතුව රු.22,864,441ක් පැවති අතර, ඉන් නිරවුල් නොකර පවතින කාලය වසර 5 ට වැඩි ශේෂය රු. 8,340,991 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂයන් 2024 වර්ෂය තුළදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ඇ) | 2018 වර්ෂයේ සිට ඉකුත් වර්ෂය දක්වා කාලය තුල අවුරුදු 4 ක කාලයක් සඳහා ගොඩනැඟිලි සංවර්ධන අයදුම්පත්‍ර 613 ක් ලැබී තිබුණු අතර, ඉන් අයදුම්පත් 417 ක් අනුමත කර තිබුණද, එම කාලය තුල අනුකූලතා සහතික 25 ක් පමණක් නිකුත් කර තිබුණි. එසේම අනුමත නොකළ අයදුම්පත් 196 ක් සම්බන්ධව පසු විපරම් කිරීමක්ද සිදුකර නොතිබුණි. | ගොඩනැගිලි අයදුම්පත් කොටසක් පමණක් අනුමත කිරීමට නොහැකි වූයේ වෙනත් ආයතනය මගින් ලබා දෙන නිර්දේශ නොමැති වීම හේතුවෙන් බව හා අනුකූලතා සහතික ලබා ගන්නා ලෙස අදාළ අය වෙත ලිඛිතව දන්වා ඇති බව. | පසු විපරම් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හා අනුකූලතා සහතික නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කඩකුලී ගිවිසුමේ 06 (I) ඡේදය ප්‍රකාරව ගිවිසුම් අත්සන් කිරීමට ප්‍රථම බදු ගැණුම්කරු විසින් සභාවේ ඇප තැන්පත් කළයුතු වුවද, රත්තොට සභාවේ ගිවිසුම් කාලය අවසන් වූ කඩ කාමර 38ක එකතුව රු.419,602 ක ඇප තැන්පත් ද ගිවිසුම්ගතව දැනට පවත්වාගෙන යන කඩ කාමර 58 ක එකතුව රු.657,250 ක ඇප තැන්පත් ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත්, බදුකරුවන්ගෙන් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | ඇප තැන්පත් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | ඇප තැන්පත් අයකර ගත යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 10 ක පුරප්පාඩු 15 ක් ද එක් තනතුරකට අදාළව අතිරික්ත 2 ක් ද පැවතුණි. | ආයතනගත තනතුරු වලට බඳවා ගැනීම් සියල්ල මේ වන විට අත්හිටුවා ඇති බව. | අනුමත කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාමට කටයුතු කළයුතුයි. |
| (ආ) | විශ්‍රාම ගිය , සේවය හැර ගිය, මිය ගිය හා තාවකාලික සේවය නවතා ඇති සේවකයින් 07 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 2 ත් 5 ත් අතර හා වසර 5 ට වැඩි කාලයක සිට එකතුව රු.442,868 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයවියයුතු මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් අයකර ගත යුතුය. |

## 3.4 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමකින් තොරව 2021 වර්ෂයේ රු.2,964,803 ක් වැයකර ඉදිකර තිබුණු කුරුවාව ළමා උද්‍යානය ඉදිරිපිට හෙළ බොජුන් හල 2024 පෙබරවාරි 05 විගණන දින වන විට මාස 8 ක කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි. | නව ගැනුම්කරුන්වන් වෙත ලබා දීම සඳහා මිළ ගණන් කැඳවා දැන්වීම් ප්‍රසිද්ධ කර ඇති අතර,සුදුසු ගැනුම්කරුවෙකු ඉදිරිපත් වූ පසු එම ගැනුම්කරු වෙත ලබා දීමට කටයුතු කරන බව. | වත්කම් උපයෝජනය සඳහා කටයුතු කළයුතුයි. |
| (ආ) | සභාව සතු රු. 31,207,188 ක් වටිනා ගොඩනැඟිලි 04 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි . | ඉදිරියේදී සංවර්ධනය කිරීමට කටයුතු කරන බව. | -එම-. |

## 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් අනුබෙදුම් කර විකිණීමේදී සභාවට ලබාදී ඇති ඉඩම් කොටස් 03 ක අයිතිය පවරා ගෙන නොතිබුණි. | ඉඩම් 3 ඔප්පු මගින් ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු කරන බව . | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව පරිහරණය කරන රු.2,178,044 ක ඉඩම් 09 ක අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි . | ඉදිරියේදි නිවැරදි කිරිමට කටයුතු කරන බව. | අයිතිය පවරා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | රත්තොට බණ්ඩාරපොල වත්ත, නිල්දිය දහර නැමැති වෙන්දේසියේ විකුණන ලද ඉඩමෙන් සභාව වෙත වෙන්කර තිබුණු අක්කර 01 රූඩ් 01 පර්චස් 04 ක වපසරියකින් සමන්විත ඉඩම් කොටසේ අයිතිය පවරාගෙන නිරවුල් කර නොතිබුණි. | දෙපාර්ශවය මුණගැසී අදාළ ඉඩම්වල ඔප්පු ලබා ගෙන ඉඩමේ භුක්තිය නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | භුක්තිය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ඈ) | ඉඩම් අනුබෙදුම් කර වෙන්දේසියේ විකුණන ඉඩම් දෙකකින් සභාවට පවරාගෙන ඇති පර්චස් 46 ක වපසරයකින් සමන්විත ඉඩම් කොටස් 02 ක් පෞද්ගලික පරිහරණය සඳහා ඉඩ ලබාදී තිබුණි. | පෞද්ගලික පරිහරණය කරන කොටසට අදාලව තක්සේරුවක් ලබා ගෙන එම මුදල අයකර ගැනිමට කටයුතු කරන බව. | පොදු කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

**පරිසර ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පරිසර ආරක්ෂන බලපත්‍රයේ වලංගු කාල සීමාව අවසන් වී කාලයක් ගත වී තිබූ ව්‍යාපාර 07 ක් පරිසර බලපත්‍රය අළුත් කර නොතිබූ අතර, අදාල නිලධාරීන් විසින් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර උක්ත ව්‍යාපාර වසා දමා තිබේද ව්‍යාපාර කටයුතු කරගෙන යන්නේද යන්න තහවුරු කර ගෙන නොතිබුණි. | අදාළ පාර්ශව දැනුවත් කර ඒ සම්බන්ධව ඉදිරියේදී කටයුතු කරන බව. | නිසි අධික්ෂණයකින් කටයුතු කළ යුතුය. |